# වැවිලි අමාත්‍යාංශය

## පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

### තනතුර : කළමනාකරු (ආදර්ශ පොල් උයන් හා නවාන් සංවර්ධන අංශය) - II ශ්‍රේණිය

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

කෘෂිකර්ම / වැවිලි කළමනාකරණ / ආර්ථික විද්‍යාව / ව්‍යාපාර කළමනාකරණය / කළමනාකරණය සංවර්ධන පරිපාලනය විෂයන් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

සහ

රජයේ සංස්ථා / මණ්ඩල / රජය පිළිගත් ආයතනයක පරිපාලන හා වතු කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසර 05 ක සේවා පළපුරුද්ද

හෝටල් කළමනාකරණ / හෝටල් සත්කාරක සේවා පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් තිබීම විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

එසේම කෘෂිකර්ම / කළමනාකරණ / මානව සම්පත් කළමනාකරණ / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය ප්‍රසම්පාදන / කටයුතු පිළිබඳ ඩිප්ලෝමාවක් තිබීම හා පරිගණක භාවිත හැකියාව හා වෙනත් භාෂාවක් පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් කාණ්ඩය** : MM 1-1

**වැටුප් පරිමාණය** : රු. 53,175 - 1,375 x 10 - 1,910 x 15 - 95,575

**වයස** : වයස අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ / සංස්ථා / මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### තනතුර : සහකාර කළමනාකරු (ප්‍රවාහන හා යන්ත්‍රෝපකරණ) - වතු II ශ්‍රේණිය

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක්

හෝ

II. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

IV. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක/ මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

- වාහනවලට අදාළ වාර්තා නඩත්තු කිරීම පිළිබඳව පළපුරුද්දක් තිබීම, වාහන සමූහයක ක්‍රියාකාරීත්වය සහ එහි සේවක මණ්ඩල අධීක්ෂණය කිරීම පිළිබඳ හැකියාවක් තිබීම, පෙට්‍රල් හා ඩීසල් වාහන, අඩම් වාහන සහ බර වාහන පිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

**වැටුප් කාණ්ඩය** : JM 1-2

**වැටුප් පරිමාණය** : රු. 43,355 - 755x10 - 1,135x18 - 71,335

**වයස** : වයස අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ / සංස්ථා / මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### තනතුර : සහකාර අලෙවි ප්‍රවර්ධන කළමනාකරු (වතු) II ශ්‍රේණිය

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

අලෙවි කළමනාකරණය විෂය සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමග

රාජ්‍ය / සංස්ථා හෝ රජය පිළිගත් ආයතනයක අලෙවි කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 04 ක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : (JM1-2)

**වැටුප් පරිමාණය** : රු. 43,355 - 755x10 - 1,135x18 - 71,335

**වයස** : වයස අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ / සංස්ථා / මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් කොන්දේසි :**

I. සෑම අයදුම්කරුවෙක් ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- ජීව දත්ත හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. තවද දැනටමත් රජයේ / සංස්ථා / මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මඟින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන්කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම්කරන්නේ නම් එක් තනතුරකට එක බැගින් වනසේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුවේ.
- සියලුම අයදුම්පත් 2020.12.28 දින හෝ දිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේ නම්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**